## සිරස හා ලසන්ත

සිරස ආයතනයට පහර දී ගිනි තැබීම හා ලසන්ත වික්‍රමතුංග ඝාතනය කිරීම රනිල් වික්‍රමසිංහට, බංකොලොත් දේශපාලනඥයන්ට, ඊනියා මානව හිතවාදීන්ට, ජනමාධ්‍ය නිදහස වෙනුවෙන් පෙනී සිටින්නන්ට හා වෙනත් එවැන්නන්ට නැවත වරක් කොටුව දුම්රියපොළ ඉදිරිපසට හා ලිප්ටන් වටරවුමට එමට අවස්ථාව සපයා ඇත. එමෙන් ම ලංකාවේ ඇමරිකානු තානාපති බ්ලේක්ට ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා හමුවී දොස් පැවරීමට ද ඉන් ඉඩකඩ ලැබී ඇත. ඔවුන් සියළු දෙනාම ඝාතනය සම්බන්ධයෙන් දරන්නේ එකම මතයකි. ඔවුන්ට අනුව ආණ්ඩුව එයට වගකිවයුතු ය. සිරස සම්බන්ධයෙන් ඇමරිකානු තානාපති පවසන්නේ කුමක් දැයි පැහැදිලි නැත. එහෙත් එහි දී ද අනෙක් අය ආණ්ඩුවට දොස් පවරති.

ඇමරිකානු තානාපති මෙරට හැසිරෙන්නේ ත්‍රස්තවාදියකු ලෙස ය. ඔහු අරලියගහ මැදුරට ගොස් ජනාධිපතිතුමාට දොස් පවරන්නේ හන්දියේ "අයියා" කෙනකු මෙනි. එක් අතකින් සරමේ කොණක් ඔසවාගෙන අනික් අතින් ඇඟිල්ල දික්කර තර්ජනය කරන චන්ඩියකු මෙන් ඔහු හැසිරෙන්නේ අප කුඩා රටක් නිසා ද? එසේත් නැත්නම් මෙතෙක් සිටි ඇමරිකානු තානාපතිවරුන්ට මෙතෙක් සිටි ජනාධිපතිවරුන් හමුවේ එසේ හැසිරීමට ඉඩ තිබුණු නිසා ද? ඇමරිකාවේ සිටින ලංකා තානාපතිට කළ නොහැකි කිසිවක් ලංකාවේ සිටින ඇමරිකානු තානාපතිට කිරීමට ඉඩදිය යුතු නො වේ. ඇමරිකාව යනු ප්‍රජාතන්ත්‍රවාදී කිරි පැණියෙන් පිරී ඉතිරී ගිය රටක් නොවේ. එහි යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියට ඇති තැන වෙනත් කිසිම සංස්කෘතියකට නැත. එහි ඇති වධකාගාර පිළිබඳව පසුගිය දා හෙළිවිය. එවැනි දෑ සම්බන්ධයෙන් එරට අපේ තානාපති බුෂ් හමුවී දොස් පැවරුවහොත් කුමක් සිදුවේ ද?

තානාපතිවරු හැසිරිය යුත්තේ තානාපතිවරු ලෙස මිස ත්‍රස්තවාදීන් ලෙස නො වෙයි. ඔවුන් ඇත්තේ ඒ ඒ රටවල තම රටවල් නියෝජනය කිරීමට මිස ඒ ඒ රටවල දේශපාලන කටයුතුවලට ඇඟිලි ගැසීමට නො වෙයි. මොවුන්ගේ බසට ඇහුම්කම් නොදුන් පමණින් ඔවුන්ට කළහැකි ඉරිගෙඩියක් නැත. ඒ බව අප කියා ඇත්තේ අද ඊයේ නො වේ. බටහිර රටවල තානාපතිවරු සිංහලත්වයට විරුද්ධ වෙති. බටහිරයෝ සිංහලත්වයට එරෙහිව ප්‍රභාකරන් නම් ත්‍රස්තවාදියාට ආධාර කළහ. ඔහුට ආයුධ පවා ලබාදුන්හ. තානාපති වරප්‍රසාද යොදාගනිමින් බර ආයුධ වන්නියට ගෙනගියහ. අප බොහෝ කලකට පෙර කරන ලද මේ චෝදනා අද ඇත්ත වෙමින් පවතියි. පසුගිය බදාදා ගෝඨාභය රාජපක්ෂ මහතාගේ බහුනාළිකා සාකච්ඡාවේ දී මේ සම්බන්ධයෙන් ඇතැම් දේ කියනු අසන්නට ලැබිණි. ඒ කරුණු හෙළිදරවු කිරීම හා ඇතැම්විට ඉදිරිපත්කරන්නාගේ අවශ්‍යතා ද ඉක්මවා යමින් අවංකව හා විවෘතව තොරතුරු ඉදිරිපත්කිරීම ගැන ඒ මහතාට ස්තුතිවන්ත විය යුතු ය.

රටක කුඩා බව තීරණය වන්නේ රටේ විශාලත්වය හෝ ධනවත්කම හෝ දේශපාලන දර්ශනය හෝ මත නොව රාජ්‍යනායකයාගේ නිර්භීතභාවය හා අවංකභාවය මත ය. ඇමරිකාව ආසන්නයේ පිහිටි කියුබාවට මෙතෙක් කල් කොන්ද කෙළින් කරගෙන සිටීමට හැකිවුයේ කස්ත්‍රෝගේ කොන්දේ ශක්තිය මත මිස මාක්ස්වාදයේ හෝ සමාජවාදයේ හෝ අනුහසින් නො වේ. කස්ත්‍රෝ විප්ලවයට නායකත්වය දුන් අවධියේ මාක්ස්වාදියකු නොවූ බව ද අමතක නොකළ යුතු ය. කලකට පෙර ට්‍රොට්ස්කිවාදීන්ට තිබූ ප්‍රධානම ප්‍රශ්නය වුයේ කියුබාවේ කම්කරු පංති විප්ලවයක් සිදු වී ද නැත් ද යන්න ය. කියුබාව කස්ත්‍රෝවාදී රටක් ලෙස අපි හඳුනාගනිමු.

ලංකාවේ මෙතෙක් කල් සිටි ජනාධිපතිවරු (සුළු කලක් ජනාධිපතිව සිටි විජේතුංග මහතා ඒ ලැයිස්තුවෙන් ඉවත් කළ හැකි ය.) හා ජනාධිපතිනිය බටහිරයන් ඉදිරියේ වැඳ වැටුනහ. බටහිරයෝ කොටි පිම්බූහ. සොල්හයිම්ට අනුව යුද්ධයෙහි කෙළ පැමිණියකු වූ ප්‍රභාකරන් අද පැමිණ ඇත්තේ දෙමළ ජනයාගේ කෙළ පහරින් වුව ද මියයන තත්වයකට ය. සොල්හයිම්ලාගේ කෙළ පැමිණීම එබඳුය. එහෙත් රනිල්ලා හා චන්ද්‍රිකාලා සොල්හයිම් කී දේ විශ්වාස කළහ. ඒ අන්කිසිවක් නිසා නොව ඔවුන්ගේ නිවට බව නිසා ය. එහෙත් රාජපක්ෂ මහතා එසේ නො වේ. බටහිරයන් ප්‍රභාකරන්ට විරුද්ධව හමුදා මෙහෙයවීමට ආයුධ නොදුන් බව අන් කිසිවකුටත් වඩා හොඳින් ඒ මහතා දනියි. කලින් සඳහන් කළ විශිෂ්ට සාකච්ඡාවේ දී ගෝඨාභය රාජපක්ෂ මහතා සඳහන් කළ ආකාරයට ජනාධිපතිතුමාට ආයුධ ලබාගැනීම සඳහා චීනයට හා පකිස්ථානයට කතාකිරීමට සිදුවිය. වෙනත් බටහිර නොවන රටවලින් ආධාර

© Prof. Nalin De Silva

ලබාගැනීමට ද ඒ මහතාට සිදු වී ඇත. ලසන්ත ඝාතනය සම්බන්ධයෙන් ආණ්ඩුවට දොස් පැවරීමට බ්ලේක්ට කිසිම අයිතියක් නැත. බ්ලේක්ට අවශ්‍ය වී ඇත්තේ කුමක් දැයි අපි දනිමු.

බටහිර ත්‍රස්තවාදීන් (මොවුහු දේශපාලන වශයෙන් ද ආර්ථික වශයෙන් ද සංස්කෘතික වශයෙන් ද ත්‍රස්තවාදීහු වෙති. ඔවුන්ගේ දැනුම ත්‍රස්තවාදීව අප මත බලෙන් පටවති. ඇතැම් විට මේ කරුණ ඊනියා සමාජ යථාර්ථයක් ගැන කතාකරමින් ඇමරිකානුවන්ට අවශ්‍ය සාහිත්‍ය විචාර උගන්වන මෙරටට පැමිණ මොණර නැටුම් රඟන අනුකාරක විචාරකයන්ට හා මෙරට උගතුන්ට නොතේරෙනවා විය හැකි ය. වහලාට තම වහල්කම නොතේරෙන්නේ යැයි කතාවක් ඇත.) අවසාන මොහොතේ දී වුව ද තැත්කරන්නේ ප්‍රභාකරන් හා කොටි ගලවාගැනීමට ය. ඊනියා මානව අයිතීන් කඩකිරීම්, මාධ්‍ය නිදහස නැතිකිරීම් ආදියට මුවාවෙමින් බටහිරයන් තැත්කරන්නේ ලංකාණ්ඩුවට බලපෑම් කිරීමට ය. ඔවුන්ට මෙරටට ඇඟිලිගැසීමට අවශ්‍ය පසුබිම ඊනියා මාධ්‍ය නිදහස නැතිකිරීම් ආදියෙන් සැකසෙයි. අප සිරස ගිනිතැබීම හා ලසන්ත ඝාතනය ගැන සාකච්ඡා කළ යුත්තේ ඒ පසුබිමෙහි ය.

සිරස ගුවන්විදුලිය ඇරඹූ දිනවලම එහි අරමුණ සිංහල බෞද්ධ සංස්කෘතිය නැසීම බව අපි කීවෙමු. විදසර පුවත්පතෙහි වැඩකළ සිරසට යැමට තීරණය කළ තරුණයකුට පෞද්ගලිකවත් සම්මන්ත්‍රණයක දී ප්‍රසිද්ධියේත් අපි ඒ බව කීවෙමු. ගෝඨාභය රාජපක්ෂ මහතා කියා සිටියේ සිරස කෙහෙම්මලක් බව ය. ඒ කෙසේ වෙතත් සිරසට පහරදුන්නේ සිරසම බව අද ආරක්ෂක ලේකම්තුමා ද ඇතුළු ඇතැමුන්ගේ මතය වෙයි. ඒ නිගමනයට පැමිණීමට යම් යම් සාක්ෂි ද ඔවුන් සතුවෙයි. යථාකාලයේ දී ඒ සියල්ල හෙළි වේයැයි සිතමි. එහෙත් සිරසට පහරදීම සැලසුම් කෙළේ කවු ද යන්න පිළිබඳ ව නම් සැක පහළ වෙයි. ඒ සිරස ද ඉක්මවා ගිය වැඩක් ද?

සිරස මෙන් ම ලසන්ත වික්‍රමතුංග ද සිංහල බෞද්ධ විරෝධී ජනමාධ්‍ය පිළිවෙතක් අනුගමනය කෙළේ ය. දූෂිතයන්ගෙන් සමන්විත ජනමාධ්‍ය නිදහස වෙනුවෙන් පෙනී සිටින ලිප්ටන් වටරවුමේ ව්‍යාපාර ද බටහිර මුදල් ලබාගෙන උගුර ලේ රහ වනතුරු කෑගසන්නේ සිංහලත්වයට විරුද්ධව ය. බටහිර තානාපතිවරු සිංහලත්වයට මුළුමනින් ම විරුද්ධ වෙති. අද මෙරටට ඇඟිලි ගැසීමට නම් සිංහල විරෝධී ජනමාධ්‍යවලට, ජනමාධ්‍යවේදීන්ට හා දේශපාලකයන්ට තාඩන පීඩන කිරීම ඵලදායී ක්‍රියාමාර්ගයක් බව බටහිරයෝ දනිති. අඩු තරමින් ඔවුන්ගේ සැලසුම්කරුවෝ දනිති. එහි දී ඝාතනකිරීම් ද ඔවුහු අමතක නොකරති. එහි දී තාඩන පීඩනවලට ලක්වන්නේ ඝාතනයවන්නේ තමන්ගේ ම ආයතන තමන්ගේ ම පුද්ගලයන් වීම ඔවුන්ට ප්‍රශ්නයක් නො වේ. එසේ ඝාතනය වන්නෝ සාමාන්‍ය ජනවහරට අනුව බිලිබෝයිලා හෙවත් බිල්ලට දෙන්නෝ වෙති. තමන්ගේ ම අයකු බිලි දී තම ක්‍රමය පවත්වාගෙන යෑම, එනම් බටහිර ක්‍රිස්තියානි නූතනත්වය පවත්වාගෙන යෑම බටහිරයන්ගේ ප්‍රතිපත්තිය වෙයි.

වත්මන් සන්දර්භයෙහි බිල්ලට දීමට සුදුසු ම වන්නේ සිංහල විරෝධි වූ ද, ඊනියා සාමයට ලැදි වූ ද, දෙමළ ජාතිවාදයට පක්ෂපාතිවූ ද ජනමාධ්‍ය ආයතන හා පුද්ගලයන් ය. ඒ ගණයෙහි ඉහළින් ම සිටියේ සිරස හා ලසන්ත වික්‍රමතුංග ය. වික්‍රමතුංගගේ පුවත්පත වූ සන්ඩේ ලීඩර් ඉතා නගනව ම සිංහල විරෝධී ආණ්ඩු විරෝධී ඒ ජා ප ගැති ප්‍රතිපත්තියක් අනුගමනය කෙළේ ය. බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ ආධිපත්‍යය සඳහා ම ක්‍රිස්තු භක්තිකයකු වූ ද බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ දාසයකු වූ ද ලසන්ත වික්‍රමතුංග ඝාතනයකිරීමෙන් බටහිරයන් එක ගලින් කුරුල්ලන් දෙදෙනකු මරාගැනීමේ තත්ත්වයක් උදාකරගැනීමට බලාපොරොත්තු විණි නම් ඒ ගැන පුදුම විය යුතු නො වේ.

සිංහලත්වයට විරුද්ධ පුද්ගලයන් ඝාතනයකිරීමෙන්, එවැනි ආයතන තාඩන පීඩනවලට ලක්කිරීමෙන් ආණ්ඩුවට චෝදනාකිරීමට අවස්ථාව ලැබෙන බව බටහිරයෝ දනිති. ඔවුන්ගේ ඉතිහාසය පුරා ම එවැනි සිද්ධි දැකගත හැකි ය. ලසන්ත ඝාතනයෙන් පසු ඉක්මණින් ම බ්ලේක් තානාපතිවරයා ජනාධිපතිතුමාට හා ආණ්ඩුවට දොස් පැවරීමට අරලියගහ මැදුරට ගියේ ය. මිනීමරුවා මරණය ගැන වඩත්ම සෝදිසිවන පුද්ගලයා බවට කතාවක් වෙයි. බ්ලේක්ගේ ඉක්මන් ගමන නිසා ම ලසන්ත ඝාතනය ගැන බටහිරට චෝදනා කිරීමට අපි ඉක්මන් නො වෙමු. එහෙත් පසුගිය සියවස් තුන හතරක කාලයෙහි ලෝකයේ නොයෙකුත් ඝාතන සිදු වී ඇති ආකාරය පිළිබඳ දැනුමක් අපට ඇත. යම් සිද්ධියකට පසු ඒ පිළිබඳ දැනුම් හෙළිවන්නට යම් කාලයක් ගතවන්නේත් දැනුම් ආධිපත්‍යය ඇත්තේ බටහිරට බැවිනි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva